**කුරුණෑගල මහා නගර සභාව - 2024**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 ව්‍යාවනය කළ මතය

කුරුණෑගල මහා නගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කුරුණෑගල මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය කිරීමේ කොටසේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 මතය ව්‍යාවනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ව්‍යාවනය කළ මතයක් පළ කරනු ලැබේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය ( මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම )

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ, ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති,රීති,වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.575,884 ක මුද්දර ගාස්තු විවිධ තැන්පතු යටතේ දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු මුද්දර ගාස්තු නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | වර්ෂයට අදාළ විගණන ගාස්තු වියදම හා ගෙවිය යුතු විගණිත ගාස්තු ගිණුම් වලින් අත්හැරී තිබුණි. | පෙර වර්ෂයට අදාල විගණන ගාස්තු වියදම නිවැරදිව ගිණුම්ගත කර ඇති අතර, ප්‍රවර්තන වර්ෂයේ විගණන ගාස්තු වියදමට අදාල ඉන්වොයිසිය 2024 දෙසැම්බර් 31 දින වන විට නොලැබෙන බැවින් එම වියදම උපචිත කර නොමැති බව. | උපචිත පදනම යටතේ ගිණුම් පිළියෙල කර ඇති බැවින් විගණන ගාස්තු සඳහා වෙන්කිරීම කර ගිණුම් තැබිය යුතුය. |
| (ඇ) | 2024 දෙසැම්බර් 31 දිනට ගබඩා තොගය තුළ රු.951,862 ක් වටිනා ස්ථාවර වත්කම් ඇතුළත් කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගබඩා තොග නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | වටිනාකම රු.138,069,759 ක් වූ වත්කම්වල පැවැත්ම හඳුනාගැනීමකින් තොරව ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | එම ශේෂ 2019 වර්ෂයට පෙර මිලදී ගත් ස්ථාවර වත්කම් වන බැවින් ඉදිරියේදී කමිටුවක් පත් කර එම වත්කම්, ලේඛන පරීක්ෂා කර බලා එම ශේෂ හඳුනා ගැනීමට කටයුතු කරන බව. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | 2022, 2023 හා 2024 වර්ෂවල ණයහිමි යටතේ ගිණුම්ගත කර තිබුණු වටිනාකම රු.130,167,441 ක් වූ කර්මාන්ත 10 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ඉටු කර නොතිබියදී ගොඩනැගිලි හා සවිකිරීම් යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. | අවසාන නොවූ ව්‍යාපෘතිවලට අදාලව ප්‍රාග්ධනිත කර තිබූ වටිනාකම ජ'නල් සටහන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | කර්මාන්ත ණය හිමි වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සත්‍ය වශයෙන් මිලදී නොගත් රු.2,484,362 ක් වූ ලී බඩු හා සවිකිරීම් ජංගම නොවන වත්කම් සහ ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි. | මිලදී නොගත් වටිනාකම ජ'නල් සටහන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේදී සත්‍ය වශයෙන් මිලදී නොගත් රු.1,500,000 ක් වූ සායනික උපකරණ ආයුද හා මෙවලම් යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. | ජ'නල් සටහන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට කිසිදු ගිවිසුම්ගත බැඳීමක් නොමැති වාර්ෂික අයවැය මඟින් වෙන්කළ රු.134,147,488 ක් වියදම් ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි. | හඳුනාගන්නා ලද වියදම් දැරීම පිණිස දෙපාර්තමේන්තු ගත අවශ්‍යතා හා ඉල්ලීම් අනුව වෙන් කිරීම් සිදු කර ඇති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (එ) | සමාලෝචිත වර්ෂය තුළ පළාත් නඩත්තු වැඩ සටහන යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති දෙකක් වෙනුවෙන් ලැබිය යුතු රු.1,981,500 ක් ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | 2025 වර්ෂයේ ගිණුම මගින් නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඒ) | පෙර වර්ෂවල ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සඳහා සමාලෝචිත වර්ෂය තුළ ලැබුණු රු.1,044,080 ක් ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර ගිණුමට බැර කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි. | 2025 වර්ෂයේ ගිණුම මගින් නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඔ) | කුරුණෑගල මහජන පුස්තකාලයට 2023 / 2024 වර්ෂයන්හි පරිත්‍යාග වශයෙන් ලද රු.138,045 ක පොත්, ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ජර්නල් සටහන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඕ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැංකු සනාථන ලිපි අනුව ස්ථාවර තැන්පතු වටිනාකම රු. 50,479,357 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එය රු. 52,687,702 ක් ලෙස රු.2,208,345 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ක) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ සනාථන ලිපිය අනුව ලංකා බැංකු ණය ගිණුමෙහි ශේෂය රු. 900,740,034 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු. 933,639,844 ක් ලෙස රු.32,899,810 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | බැංකු සනාථන ලිපිය අනුව ශේෂය නිවැරදි කිරීම සඳහා කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ග) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ සනාථන ලිපිය අනුව කල්බදු ණය හා පොළිය රු. 138,005 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු. 897,639 ක් ලෙස රු.759,634 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | පරීක්ෂා කර බලා නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ච) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට MC Plaza සෝලා පද්ධතියෙන් දෙසැම්බර් මාසයට අදාළ ලැබිය යුතු රු.469,986 ක ආදායම ගිණුම්ගත කර නොතිබුණි. | 2025 වර්ෂයේ ගිණුම මගින් නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ජ) | මධ්‍යම වෙළඳපල ඉදිකිරීම සඳහා දේශීය ණය සංවර්ධන අරමුදලෙන් ලබාගෙන තිබුණු ණය සඳහා සමාලෝචිත වර්ෂය තුළ ගෙවිය යුතු ණය වාරික හා පොලිය සඳහා රු.11,698,149 ක් වර්ෂය තුළ ගෙවා තිබුණු අතර, තවදුරටත් රු.390,274,899 ක් වර්ෂය තුළ ගෙවිය යුතු වුවත් ඒ සඳහා වෙන්කිරීම් සිදු කර නොතිබුණි. | හිඟ ණය මුදල් ඉදිරි අයවැය ලේඛන මගින් වෙන් කිරීම් කර ගෙවීම් කිරීමට කටයුතු කරන බව. | ණය වාරික හා පොළිය සම්බන්ධයෙන් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ට) | නව මධ්‍යම වෙළඳපල ව්‍යාපෘතිය සඳහා ලැබිය යුතු එක්වන් මුදල් (key money) තක්සේරු ආදායම රු.1,197,662,247 ක් වන අතර ඉන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.680,960,217 ක් ආදායම ලෙස හඳුනා ගත යුතු වුවත් 2021 සිට 2024 කාලය තුළ ආදායම ලෙස රු.1,417,137,000 ක් ගිණුම්ගත කිරීම නිසා රු.736,176,783 කින් ප්‍රාග්ධන ආදායම් වැඩිවී තිබුණි. | නව තක්සේරුව ඇතුලත් කර උපලේඛන හා ගිණුම් නිවරැදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඩ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නව මධ්‍යම වෙළඳපල ව්‍යාපෘතිය සඳහා ලැබිය යුතු එක්වන් මුදල් (key money) වටිනාකම තුළ ටෙන්ඩර් ලබා නොදුන් කඩ කාමර 58 ක එක්වන් මුදල් (key money) වටිනාකම රු.516,702,030 ක් ඇතුළත් වීම හේතුවෙන් හිඟ හිටි ප්‍රාග්ධන ආදායම් එම ප්‍රමාණයෙන් වැඩි වී තිබුණි. | මෙම මුදල විකිණීමට පවතින කොටස්වලට අදාළ අපේක්ෂිත ආදායම වන අතර එය නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ණ) | නව මධ්‍යම වෙළඳපල නිවාස සංකීර්ණයේ තක්සේරු ආදායම රු.682,500,000 ක් 2021 හා 2022 වර්ෂයේ ආදායම ලෙස හඳුනාගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් නිවාස ටෙන්ඩර් කර විකුණා නොතිබුණි. ඒ අනුව හිඟ හිටි ප්‍රාග්ධන ආදායම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | අනපේක්ෂිත සමාජ ආර්ථික හේතුන් මත විකුණුම් කටයුතු ප්‍රමාදව ඇති අතර, 2025 වර්ෂයේදී විකුණුම් කටයුතු අවසන් කිරීමට තටයුතු කරන බව. | ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ත) | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට 2024 ජූනි සිට දෙසැම්බර් දක්වා ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල් රු.607,948 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2025 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ද) | 2024 දෙසැම්බර් 31 දිනට මෝටර් රථ තක්සේරු වටිනාකම ගිණුම්ගත නොකිරීම හේතුවෙන් මෝටර් රථ 62 ක වටිනාකම රු.40,835,000 ක් අඩුවෙන්ද මෝටර් රථ 17 ක වටිනාකම රු. 5,750,000 ක් වැඩියෙන්ද දක්වා තිබුණි. | පරීක්ෂා කර බලා නිවැරදි කිරිමට කටයුතු කරන බව. | නිවැරදිව තක්සේරු වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (න) | වාහන 04 ක වටිනාකම රු.83,000,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | පරීක්ෂා කර බලා නිවැරදි කිරිමට කටයුතු කරන බව. | වත්කම්වල වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ප) | ගොඩනැගිලි සවිකිරීම් සහ පරිගණක හා උපාංග වටිනාකම ගිණුම්ගත කිරීමේදී 2020 සිට 2024 වර්ෂවල සිදුකළ ගනුදෙනු පමණක් ගිණුම් ගතකර තිබුණු අතර මහා නගර සභාව සතු 2020 ට පෙර ඉදිකර තිබුණු ගොඩනැගිලි 204 ක් සහ 2020 ට පෙර මිලදී ගත් පරිගණක හා උපාංග වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | පරීක්ෂා කර බලා නිවරැදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (බ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මල්කඩුවාව ආදාහනාගාරයේ පැවති රු.275,286 ක් වූ ගෑස් තොගය සහ සුන්දරාපොළ කසල අංගනයේ පැවති රු.2,916,422 ක් වූ පොහොර බෑග් සහ කාබනික පොහොර තොග තොග ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | 2025 අවසන් ගිණුම තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ම) | සමාලෝචිත වර්ෂය තුළ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා දරා තිබුණු රු.3,391,499 ක ජංගම නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ජර්නල් සටහන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ය) | සුරතල් සතුන් සඳහා ආදාහනාගාරයක් ඉදි කිරීම සඳහා 2020 වර්ෂයේ ණයහිමි ලෙස රු.1,100,000 ක් වෙන්කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ව්‍යාපෘතිය ඉටු නොකර ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර තිබුණි. | නිවරැදි කිරීමට කටයුතු කරන බව. | ගොඩනැගිලි වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ර) | නගර සභාව දේශීය සංවර්ධන අරමුදලෙන් හා ලංකා බැංකුවෙන් ලබාගෙන තිබුණු දිගු කාලීන ණය ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම හා ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාල ණය ශේෂ නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ල) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ණය සංවර්ධන අරමුදලේ ණය ශේෂය රු. 788,547,073 ක් වුවත් එය රු. 789,238,643 ක් ලෙස රු.691,570 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ සනාථන ලිපියට අනුව ශේෂය නිවැරදි කිරීම සඳහා කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ව) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත් පොලී ආදායම රු. 4,062,977 ක් විය යුතු වුවද එය රු. 4,943,097 ක් වශයෙන් රු.880,120 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2025 වර්ෂයේ ගිණුම මගින් නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉංජිනේරු අංශයේ කළ වැඩ වටිනාකම් අනුව මධ්‍යම වෙළඳපල, සායන මධ්‍යස්ථානය හා පෙර පාසල් ගොඩනැගිල්ල ඉදිකිරීම් පිරිවැයත් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධනීත කළ වටිනාකමත් අතර රු.1,100,601,691 ක වෙනසක් පැවතුණි. | පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම්වල ශේෂය හා ප්‍රාග්ධනයට ආදායමින් දායකවීමේ ගිණුම් ශේෂය අතර රු.19,683,603ක වෙනසක් පැවතුණි. | පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයන් 27 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා උප ලේඛන අනුව ශේෂය අතර රු. 276,205,687 ක වෙනසක් පැවතුණි. | පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උපලේඛන හා ශේෂ සනාථන තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.930,106,447 ක් වූ ගිණුම් විෂයන් 09 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය/ සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | ගිණුම් විෂයන් 09 ට අදාළව උපලේඛන ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ තහවුරු කරන තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1947 අංක 16 දරණ මහා නගර සහා ආඥා පනත සහ රජයේ ඉඩම් ආඥා පනතේ 27 වගන්තිය | පැවරුම් නියෝග යටතේ පළාත් පාලන ආයතනයකට පවරන ලද ඉඩමක පරම අයිතිය රජය සතුවන අතර ජනාධිපතිවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව තෙවන පාර්ශවයකට බැහැර කිරීමට එකී පළාත් පාලන ආයතනයට හිමිකම් නොමැති වුවත් TPS පිටු අංක 1/50/14 හි 95 දරන ඉඩම හෙවත් රෝහල ඉදිරිපිට ඉඩම GC-54-2019-02.12 දරන මහා සභා සම්මුතියට අනුව 2020 මැයි 19 දින සිට 2035 මැයි 18 දින දක්වා කාලයකට දීර්ඝ කාලීනව බදු ලබා දී තිබුණි. | පැවරුම් නියෝගය ලද පසු අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය සඳහා ඉදිරියේදී යොමු කිරීමේ අපේක්ෂාවෙන් මෙම දේපළ නිෂ්කාර්ය වත්කමක් වීම වළක්වා ආදායම් උත්පාදනය කිරීම පිණිස සහ මහා නගර සභාවට ආදායමක් ලබාගැනීමේ අරමුණින් එවකට සභාව විසින් ගන්නා ලද තීරණයක් පරිදි බදු දීමට කටයුතු කර ඇති බව. | මහා නගර සභා ආඥා පනත හා ඉඩම් ආඥා පනත අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මු.රෙ. 751 | කායවර්ධන මධ්‍යස්ථානය සතුව පවතින රු.8,152,527 ක් වූ ව්‍යායාම උපකරණ හා අවමංගල්‍යය ශාලාව සතුව පවතින භාණ්ඩ, බඩු ලේඛන පොතක සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි. | පවතින සියලුම භාණ්ඩ බඩු ලේඛන පොතක සටහන් කිරීමට පියවර ගෙන ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මු. රෙ. 756 | 2024 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | මු.රෙ.1645(ආ) | තමා භාරයේ ඇති එක් එක් වාහනය වෙනුවෙන් තම කාර්යාලයේ 267 වැනි පොදු ආකෘති පත්‍රයේ ප්‍රකාරව වාහන ලොග් සටහන් පොතක් තබාගෙන නිතිපතා එහි ලිවිය යුතු සියලුම සටහන් ලියනු ලැබිය යුතු වුවත්, අදාල වගකීම දරන නිලධාරියා ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මේ වන විට සියලුම වාහන සඳහා ලොග් සටහන් පොත් තබාගෙන යාවත්කාලීන කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| (i) | 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | නගර සභාව සතු වාහන 94 ක ආයතනයේ නම සලකුණු කර නොතිබුණි. | ආයතනයේ නම සළකුණු කර නොමැති සියළුම වාහනවලද නම සළකුණු කිරීමේ කටයුතු සිදු කරමින් පවතින බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3(1) ඡේදය | මහා නගර සභාවට අයත් වාහන 34 ක ඉන්ධන දහන පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. | ඉන්ධන දහන පරීක්ෂාව මේ වන විට සිදුකරමින් පවතින බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ | | | |
| (i) | 1984 නොවැම්බර් 20 දිනැති අංක 1984/19 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 6.1 ඡේදය | දිරි දීමනා ගෙවීමේදී එක් මසකදී කරනු ලබන ගෙවීම් ඔවුන්ගේ මාසික ඒකාබද්ධ වැටුප නොඉක්මවිය යුතු වුවත් 2022 සිට 2024 සැප්තැම්බර් දක්වා වරිපනම් අංශයේ ආදායම් පරීක්ෂකවරුන් 14 ක් සඳහා අවස්ථා 117 ක දී මාසික ඒකාබද්ධ වැටුපද ඉක්මවා දිරි දීමනා ගෙවීම් කර තිබුණි. | පවතින වරිපනම් හිඟය අවම කර ගැනීමේ උපක්‍රමශීලී ක්‍රමයක් ලෙස , 2020 පෙබරවාරි 13 දිනැති GC – 06(06) දරණ මහා සභා සම්මුතිය අනුව හිමිකරුවන් වරිපනම් බදු නොගෙවීම මත එකතු කරන දඩ මුදලින් කොටසක් පමණක් ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය හා කාර්යාල නිලධාරින් අතර සභා අනුමැතිය පරිදි ගෙවීම් සිදු කර ඇති බව. | චක්‍රලේඛය උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 7 ඡේදය | බදුකරුවන් විසින් සිය කඩකාමර අතුරු බද්දට දීම සම්පූර්ණයෙන්ම තහනම් වන අතර , එවැනි අවස්ථාවක දී බදුකරුගේ බලපත්‍රය අවලංගු කළ යුතු බව දක්වා ඇතත්, නව මධ්‍යම වෙළඳපොල අදියර III කඩකාමර ඉදිකිරීමේදී කඩා ඉවත් කළ කඩකාමර වෙනුවට ලබාදී තිබුණු තාවකාලික කඩකාමර, අයිතිකරුවන් විසින් අතුරු බදු දී තිබුණි. | අතුරු බදු දී ඇති කඩ කාමර පරීක්ෂා කර ඉදිරි කටයුතු සිදු කරන බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.150,019,410 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.144,435,202 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වටිනාකම රු.7,545,153 ක් වූ බැංකු ගිණුමකට අදාළ ශේෂය සඳහා බැකු සනාථන ලිපි ලබාගෙන නොතිබුණි. | බැංකු සනාථ ලිපි ලබා ගැනීමට කටයුතු කරන බව | ශේෂ සනාථ ලිපි ලබාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් , රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

කොමසාරිස් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2024 වර්ෂය | | | | 2023 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 482,370 | 723,357 | 654,686 | 402,829 | 494,500 | 511,538 | 443,758 | 334,158 |
| කුලී | 215,004 | 100,777 | 100,426 | 10,798 | 116,375 | 101,548 | 105,585 | 10,441 |
| බලපත්‍ර ගාස්තු | 38,376 | 29,156 | 26,156 | - | 16,402 | 29,439 | 29,439 | - |
| වෙනත් ආදායම් | 38,376 | 154,223 | 156,676 | 119,118 | 655,365 | 491,596 | 501,211 | 121,571 |
| එකතුව | 774,126 | 1,007,513 | 937,944 | 532,745 | 1,282,642 | 1,134,121 | 1,079,993 | 466,170 |

**2.3.2 ආදායම් රැස් කිරීමේ කායර්සාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බිල්කළ ආදායම රුපියල් මිලියන 1,007.51 ක් වූ අතර පෙර වර්ෂයන්ට අදාළ හිඟ ආදායම් ලැබීම්ද ඇතුළුව රුපියල් මිලියන 937.94 ක් සමාලෝචිත වර්ෂයේ රැස්කර තිබුණි. ඉකුත් වර්ෂයේ හිඟ සමඟ සමාලෝචිත වර්ෂය අවසානයේදී රුපියල් මිලියන 532.74 ක් තව දුරටත් අයකර ගැනීමට පැවතුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කරමින් පවතින බව. | බිල්කළ ආදායම් හා හිඟ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | **වරිපනම් හා බදු** | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ පැවති වරිපනම් බදු හිඟය රුපියල් මිලියන 334.16 ක් වූ අතර, එයින් රුපියල් මිලියන 134.75 ක් සමාලෝචිත වර්ෂය තුල ලැබී තිබුණි. 2024 වර්ෂයට අදාළ බිල්කිරීම් රුපියල් මිලියන 723.36 කින් රුපියල් මිලියන 519.93 ක් ලැබී තිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු වරිපනම් ශේෂය රුපියල් මිලියන 402.83 ක් වී තිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කරමින් පවතින බව. | හිඟ ආදායම් හා බිල්කළ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | කුරුණෑගල වැව ආශ්‍රිත විනෝද සේවා පවත්වාගෙන යාම සඳහා පෞද්ගලික ආයතනයක් සමඟ 2020 ජනවාරි 01 දින සිට 2034 දෙසැම්බර් 31 දක්වා වර්ෂ 15 ක කාලයක් සඳහා දීර්ඝ කාලීන බදු ගිවිසුමක් අත්සන් කර තිබුණි. නමුත් ගිවිසුම අනුව බදුකරු මාසික ගාස්තු ගෙවීම පැහැර හැර තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් සභාව එකඟතා ගිවිසුම අනුව කටයුතු නොකිරීමෙන් 2020 වර්ෂයේ රු. 1,042,000 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | කොරෝනා තත්ත්වය හේතුවෙන් 2020 වර්ෂය සඳහා ගාස්තු අය කර නොගැනීමටත් 2021 ජනවාරි සිට ගිවිසුම් ප්‍රකාරව ගාස්තු අය කිරීම සුදුසු බවත් 2021 අප්‍රේල් 08 දිනැති GC/6/15/2021/04/08/ A/C1 දරණ මහා සභාව සම්මත කර ඇති බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | **කුලී** | | |
| | බදු දී තිබුණු නව මධ්‍යම වෙළඳපොල කඩ කාමර 66 න් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.135,814,922 ක එක්වන් මුදලක් (key money) සභාවට අයවීමට පැවතුණි. | බදු දී ඇති කඩ කාමරයන්හී හිඟ කී මනි (Key Money) වාරික අය කර ගැනීමට කටයුතු කරන බව. | ගිවිසුම් ප්‍රකාරව හිඟ කී මනි (Key Money) අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

(ඇ) **බලපත්‍ර ගාස්තු**

| | | |
|---|---|---|
| සභාබල ප්‍රදේශයේ කොට්ඨාශ අංක 03, 05 හා 06 ට අදාළව දැන්වීම් පුවරු මඟින් වාර්ෂිකව අයවිය යුතු රු.7,805,748 ක් අයකර නොතිබුණි. | ගාස්තු ගෙවා නොමැති පුවරු සඳහා අවසන් නිවේදන නිකුත් කර ඇති බව. | ගාස්තු ගෙවා නොමැති පුවරු සඳහා මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**2.3.3** අධිභාර

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභා ආඥා පනතේ විධි විධාන ප්‍රකාරව වගකිවයුතු අයවලුන්ට එරෙහිව සමාලෝචිත වර්ෂය තුළ දී රු.710,669 ක අධිභාරයක් පනවා තිබුණි. | අධිභාර සහතික නිකුත් කළ පසු ඉදිරි කටයුතු සිදු කිරීමට අපේක්ෂිතය. | අධිභාර සහතිකය ඉදිරියේදී නිකුත් කිරීමට කටයුතු කරන බව. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් 07 ක පැවති රු.464,596,379 ක ශේෂයෙන් වර්ෂ 05 ක් ඉක්මවූ රු.46,770,750 ක් පැවතුණි. මෙම ශේෂය අයකර ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි. | පැරණි වර්ෂවල සිට පැවත එන ශේෂ එකතුන් වන බැවින් පරික්ෂා කර බලා අය කර ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් 16 ක පැවති රු.2,339,604,722 ක ශේෂයෙන් වර්ෂ 05 ක් ඉක්මවූ රු.77,902,440 ක් විය. ශේෂයන්ගේ පැවැත්ම සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ශේෂවල පැවැත්ම සොයාබලා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | නයිට් බසාර් ( Night Bazaar ) වෙළඳ ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ අරමුණින් පොල පවත්වන ලද භූමියට විදුලි සැපයුමක් ලබා ගැනීම සඳහා රු.94,205 ක් හා අපජල සම්බන්ධතාවයක් ලබාගැනීම සඳහා රු.173,892 ක පිරිවැයක් දරා තිබුණද , මෙම වෙළඳපොල වර්තමානයේ ක්‍රියාත්මක නොවන බැවින්, දරන ලද පිරිවැය අනාර්ථික වී තිබුණි. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර පවත්වාගෙන යාමේදී පවතින අඩුපාඩු හේතුවෙන් තාවකාලිකව මෙම ව්‍යාපෘතිය නවතා දැමීමට සිදුවිය. | විධිමත් ශක්‍යතා අධ්‍යයනයක් තුළින් ව්‍යාපෘතීන් ආරම්භ කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ඈ) | 2024 දෙසැම්බර් 31 දිනට සභාවේ නොපියවූ වැටුප් අත්තිකාරම් තුළ රු.1,330,170 ක හඳුනා නොගත් ණය ශේෂයක් පැවතිණි. | ගිණුම් පරික්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ණය ශේෂය හදුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මළාපවහන පද්ධතියේ ලැබිය යුතු හිඟ ශේෂය රු.168,188,180 ක් විය. | විකල්ප උපාය මාර්ග තුළින් හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු ජල ගාස්තු හිඟ ශේෂය රු.139,775,763 ක් විය. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අවමංගල්‍යය ශාලාව පිහිටි භූමියේ පෞද්ගලික ව්‍යාපාරිකයින් විසින් කරගෙන යනු ලබන කේටරින්, හඬ සහ නෙස්කැෆේ සේවාවන් සඳහා මහා නගර සභාවේ අවසරයකින් හෝ ටෙන්ඩර් කිරීමකින් තොරව භූමිය භාවිතයට ගෙන තිබුණි. | කුරුණෑගල මහා නගර සභාවට අයත් අවමංගල්‍යා ශාලාව ගාස්තු අය කර ලබාදෙන අතර එහිදී ආහාර පාන සැපයීම නගර සභාව විසින් සිදු කරනු නොලබන බව. | සභා දේපළ උපයෝගී කරගෙන පෞද්ගලික ව්‍යාපාරිකයන් ව්‍යාපාර කටයුතු සිදු කිරීම පාලනය කළ යුතුය. |
| (ආ) | මහා නගර සභාව විසින් ලංකා බැංකුවෙන් ලබාගන්නා ලද රු.700,000,000 ක ණය මුදලෙහි පොලී ගෙවීම් සිදු කරනු ලබන අතර 2025 අගෝස්තු 08 දිනට පෙර අදාළ ණය මුදල් සම්පූර්ණයෙන් ගෙවා අවසන් කළ යුතු වුවත් 2025 මාර්තු 31 වන විටත් කිසිඳු ණය වාරිකයක් ගෙවීමට මහා නගර සභාව කටයුතු කර නොතිබුණි. | විගණනය විසින් පෙන්වා දි ඇති රු. මි. 700 ක ණය මුදල ගෙවීම් කිරීම සඳහා අපේක්ෂිත ආදායම් නොලැබීම මත 2025 මාර්තු 31 වන විට ණය වාරික ගෙවීම් කර නොමැති අතර ඒ සඳහා ඉදිරියේදී ණය ගෙවීමට සහන කාලයක් ලබා ගැනීමට කටයුතු කරන බව. | එකඟතා ගිවිසුම අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | දේශීය ණය සංවර්ධන අරමුදල මගින් 2021 මාර්තු 23 දින රු. මිලියන 800 ක ණය මුදලක් ලබාගෙන තිබුණු අතර එම ණය මුදලින් රු. මිලියන 400 ක් 2025 මාර්තු 23 දින වන විටත් ඉතිරිව තිබුණි. මෙම මුදල 2026 මාර්තු 23 දින වන විට ගෙවා අවසන් කළ යුතුව තිබුණි. | මධ්‍යම වෙළඳපොල ව්‍යාපෘතියෙහි ඉතිරි ව්‍යාපාර කොටස් අලෙවි කර ණය මුදල් නිරවුල් කිරීමට කටයුතු කරන බව. | එකඟතා ගිවිසුම අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | නගර සභාව සතු රන්තලිය තානායමෙහි පරිපාලන කටයුතු නාගරික සංවර්ධන අධිකාරියට පවරා දී තිබුණද, දෙපාර්ශවය අතර ඇතිකර ගන්නා ලද එකඟතා ගිවිසුමක් විගණනයට ඉදිරිපත් නොවිය. | ගොනුවට අනුව නගර සභාව හා රන්තලිය තනායම අතර ඇතිකරගත් ගිවිසුමක් නොමැති බව. | එකඟතා ගිවිසුමක් යටතේ කටයුතු කළ යුතුය. |
| (ඉ) | දීර්ඝකාලීනව බදුදෙන ලද දේපළක බදු මුදල වසර 05 කට වරක් හෝ සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු වුවත්, නාගරික සංවර්ධන අධිකාරියට බදු දෙන ලද | ගොනුවට අනුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් බදු මුදල් සංශෝධනය කිරිම සම්බන්ධව තොරතුරු ඇතුලත්වී නොමැති බව. | එකඟතා ගිවිසුමක් අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රන්තලිය තානායමේ බදු මුදල් සංශෝධනය කිරීමට කටයුතු නොකර ඒකාකාරී බදු මුදලක් අයකර තිබුණි. | | |
| (ඊ) | මධ්‍යම වෙළඳපොල ඉදිකිරීම අදියර III යටතේ කඩකාමර 99 ක් ඉදිකර බදු ලබාදීම පිළිබඳ පරීක්ෂාව | | |
| (i) | අංක GC/06/08/2021/02/10/ AR/03 දරන මහා සභා තීරණය අනුව එකවර ගෙවන මුදලෙන් 2/3 ක වටිනාකම වාරික 5 කින් ගෙවීමටත්, ගෙවීම ප්‍රමාද කරන ටෙන්ඩර්කරුවන්ගෙන් සියයට 10 ක දඩ මුදලක් අය කිරීමටත් තීරණය කර තිබුණද 2024 ජූලි 05 දින වන විට එකවර ගෙවන මුදල නියමිත පරිදි අය නොකිරීම හේතුවෙන් රු. 2,823,623 ක දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම කඩ කාමර සම්බන්ධයෙන් නඩුවක් ක්‍රියාත්මක වන බැවින් මුදල් අයකිරීම්, කඩ කාමරවල ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීම සහ කටයුතු අත් අහිටුවා ඇති බව. | දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | කඩකාමර සම්බන්ධයෙන් අංක SC/FR/212 /2021 දරන නඩුව ක්‍රියාත්මකව පවතින බැවින් 2023 ජනවාරි 04 දින රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් කඩකාමර සඳහා ලබාදී තිබුණු මාසික කඩ කුලී අයකර ගැනීමට නොහැකි වීමෙන් සභාවට වසරකට අහිමි වන කඩකුලී ආදායම රු.13,896,000 ක් විය. | කඩකාමර සම්බන්ධයෙන් නඩුවක් ක්‍රියාත්මක වන බව. | කඩ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) | මහජන පොළ භූමියේ රථවාහන නැවතුම්පල බදාදා, සෙනසුරාදා සහ ඉරිදා යන දිනවල පමණක් ගාස්තු අයකරන අතර ඉතිරි දිනවල වසා තැබීම නිසා භූමිය නිෂ්කාර්යව පැවති නිසා සභාවට ලැබිය යුතු විශාල ආදායමක් අහිමි වී තිබුණි. | පොල භූමිය විශාල වුවද පොල නොපැවැත්වෙන දිනයන්හි මෙම ස්ථානයට ඉල්ලුම අඩු බව. | සභා දේපළවලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | නගර සීමාව තුල රථවාහන නැවතුම් ස්ථාන 15 ක් හඳුනාගෙන තිබුණද එම ස්ථාන සම්බන්ධයෙන් නගර සභාවේ අධීක්ෂණය දුර්වල මට්ටමක පැවතීම තුල දෛනිකව ලබාගත හැකිව තිබුණු විශාල ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | වර්තමානයේ මෙම රථගාල් ටෙන්ඩර් කිරීම සඳහා යොමුකර ඇති බව. | ආදායම් මාර්ග වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (එ) | සභාව පරිහරණය කරන ඉඩම් 92 න් ඉඩම් 62 ක නිරවුල් භුක්තිය තහවුරු කර තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මහ නගර සභාව සතු රු. මිලියන 08 වටිනා එක් ඉඩමක් පමණක් ගිණුම්ගත කර තිබුණි. | තක්සේරු කිරීමට හා අයිතිය නිරවුල් කර පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | රෝහල ඉදිරිපිට වැසිකිළි ඉඩමේ බදු කුලිය සම්බන්ධයෙන් නගරාධිපතිගේ හා නාගරික කොමසාරිස්ගේ ලිඛිත නියෝගයකට අනුව ආදායම් පරීක්ෂක විසින් මාසිකව රු.25,000ක තාවකාලික තක්සේරුවකට බිම් කුලියක් අයකර තිබුණි. 2023 ජූලි 06 දින රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් රු.1,137,600ක වාර්ෂික බදු කුලී ලෙස අයකළ යුතු බවට දක්වා තිබුණද එම තක්සේරු වටිනාකමකට බදු කුලී අයකිරීම් සිදුකර නොතිබුණි. | 2025 මැයි 28 දින තක්සේරු වාර්තාව ලැබී ඇති අතර, ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට නියමිත බව. | තක්සේරු වාර්තාවට අදාළ වටිනාකම අය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඔ) | කුරුණෑගල කොළඹ පාරේ අංක 191/12 B දරන ස්ථානයේ ව්‍යාපාරික ගොඩනැගිල්ලක් ඉදිකිරීමට නාගරික කොමසාරිස් විසින් 2023 සැප්තැම්බර් 21 දින ලබා දී තිබුණු අංක BA/66/2022 දරන අනුකූලතා සහතිකයේ කොන්දේසිය කඩකරමින් අනවසර ඉදිකිරීමක් ඉදිවෙමින් පැවතිණි. | විධිමත් අනුමැතියක් ලබාගන්නා ලෙස 2025 මැයි 27 වන දින ලිපියකින් දැනුවත් කර ඇති බව. | අනවසර ඉදිකිරීම් පාලනය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 මතභේදයට තුඩුදුන් ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1992 පෙබරවාරි 26 දිනැති අංක 05/01/119 දරන නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියට පටහැනිව සැලසුම් කමිටු කාර්යාලීය වේලාව තුළ ආරම්භ කර කාර්යාල වේලාවෙන් පසු පැය දෙකක කාලය ආවරණය නොකර දීමනා ලෙස රු.166,000 ක් ලබාගෙන තිබුණි. | අදාළ චක්‍රලේඛ ප්‍රකාරව දීමනා ගෙවීමට හා ඉන් බැහැර ගෙවීම් සිදු කර ඇත්නම් පරීක්ෂා කර ආපසු අය කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | සැලසුම් කමිටුව සඳහා 2024 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ නගර සභාව වෙනුවෙන් නියෝජනය කළ නිලධාරීන් 07 දෙනෙකු අවස්ථා 123 දී නිවාඩු ලබා තිබියදී (ඇඟිලි සලකුණු කිරීමේ පිටපතට අනුව පැමිණීම හා පිටවීම නොමැති) සැලසුම් කමිටුවට සහභාගී වූ ලෙස අත්සන් යොදා දීමනා ලෙස රු.248,000 ක් ලබාගගෙන තිබුණි. | පරීක්ෂා කර බලා පිළිතුරු සපයන බව. | නිවාඩු දින සඳහා ගෙවීම් කර ඇති මුදල් ආපසු අයකිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1947 අංක 16 දරණ මහා නගර සභා ආඥා පනතේ 188 වගන්තිය හා 1984 නොවැම්බර් 20 දිනැති අංක 1984/19 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 4.2 ඡේදයට පටහැනිව 2020 සිට 2024 සැප්තැම්බර් දක්වා කාලය තුළ හිඟ වරිපනම්වලට අදාළ වොරන්ට් මුදලින් කොමිස් වශයෙන් රු.17,331,751 ක් ගෙවා තිබුණි. | නොගෙවූ හිඟ වරිපනම් බදු අයකිරීමට දිරිගැන්වීමක් සිදු වන අතර සභාවේ ආදායමට සෘජුවම හානියක් සිදු නොවන බව. | මහා නගර සභා ආඥා පනත හා චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |

**3.4 නිෂ්කායර්ය හෝ ඌණ උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2016 වර්ෂයේ සිට මහා නගර සභාව විසින් විටින් විට මිලදී ගන්නා ලද රු.5,357,688 ක් වටිනා අයිතම 29 ක් නිකුත් නොවී ගබඩාව තුළ තිබුණු අතර ඉන් වටිනාකම රු.1,741,913 ක් වූ අයිතම 14 ක් 2020 වර්ෂයටත් පෙර මිලදීගෙන තිබුණි. | ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය සමඟ හුවමාරු කර ගැනීම හා ක්ෂේත්‍රයේ හඳුනාගෙන ඇති ස්ථාන සඳහා භාවිතයට ගැනීමට කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව භාණ්ඩ හා සේවා ලබා ගැනීමේදී අවශ්‍යතාවය අනුව හා ප්‍රසම්පාදන සැලැස්මට අනුව කටයුතු කළ යුතුය. |

**3.5 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සභාවට අයිති ඉඩමක පවත්වාගෙන ගිය පෞද්ගලික බස් රථ නැවතුම්පල ඉවත් කිරීමට සමාලෝචිත වර්ෂය වනවිටත් කටයුතු කර නොතිබුණු අතර, ඉදිකිරීම් සමාගමක් විසින් සිදුකර ඇති අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමටද කටයුතු කර නොතිබුණි. | උල්පතේවත්ත ඉඩම කුරුණෑගල මහ නගර සභාව වෙත පවරා දෙන ලෙස ඉල්ලා ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා යවා ඇති බව. | සභාවට ඉඩම් පවරාගෙන අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කුරුණෑගල ශික්ෂණ රෝහල ඉදිරිපිට පොදු වැසිකිළිය සඳහා වෙන්කර තිබූ පර්චස් 4.74 ක ඉඩම රජයේ ඉඩමක් වුවත් එය සභාව වෙත පවරාගෙන නොතිබුණු අතර මෙහි මහල් 03 කින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. | මහා නගර සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | සභාව වෙත පවරා ගත යුතුය. |
| (ඇ) | විල්ගොඩ ගවඝාතක ඉඩම විගණිත දින වන විටත් මහා නගර සභාවට පවරාගෙන නොතිබුණි. | මහා නගර සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | සභාව වෙත පවරා ගත යුතුය. |

**3.6 කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | කුරුණෑගල වැව භූ දර්ශන ව්‍යාපෘතිය III වන අදියරේ කොන්ත්‍රාත් කාලය 2023 දෙසැම්බර් 30 දිනෙන් අවසන් වුවත් 2024 ජුලි වන විටත් වටිනාකම රු.1,377,750 ක් වූ කැටගල් ඇතිරීම, පැල සිටුවීම හා පිඩලි ඇල්ලීම යනවැඩ විෂයන් සිදුකර නොතිබුණි. | මේ වන විට ශ්‍රම දායකත්වය ලබා දුන් ඉංජිනේරු සේවා බලකායේ නිලධාරීන් කාලය අවසන්ව ඇති බැවින් ඉවත්ව ඇති අතර කැට ගල් ලැබීමෙන් අනතුරුව නැවත ගෙන්වා ගෙන වැඩ අවසන් කල හැකි බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු සිදු කළ යුතුය. |
| (ආ) | පොල්අත්තාපිටිය පැරණි ප්‍රජාශාලාව නවීකරණය කිරීමට අදාළව ගිවිසුම්ගත ඇස්තමේන්තුවෙන් සියයට 27 කට ආසන්න වටිනාකම රු.1,091,019 ක් වූ වැඩ සම්පූර්ණයෙන්ම කොන්ත්‍රාත්කරු ඉටු නොකර අතහැර දමා තිබුණි. | අංක 9 යටතේ ඇති අයිතමයන් සඳහා ගෙවීම් නොකර ඇති අතර එම වැඩ කොටස් නගර සභා සෘජු කම්කරු ශ්‍රමය යටතේ ඉටු කර ඇති බව. | ඇස්තමේන්තු ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කුරුණෑගල ප්‍රධාන බස් නැවතුම්පලේ මහජනයාට ප්‍රවේශ වීමට හා මහජනයාට රැස්ව සිටිය හැකි ස්ථාන අවහිර කරමින් හා බස් රථ මනා ලෙස හැසිරවීමට ඇති ඉඩකඩ අහුරමින් මහා නගර සභා ප්‍රතිපාදන මත 2021 ජනවාරි 06 වන දින රු.4,819,537 ක මුදලකට කඩ කාමර ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත් සමාගමක් සමග ගිවිසුම්ගතව 2022 මැයි 26 වන දින රු.1,445,847 ක අත්තිකාරමක් ගෙවා තිබුණි. අංක NWP/GOV/AD/02/ 16/13 හා 2022 ජූලි 12 වන දිනැති වයඹ ආණ්ඩුකාර ලේකම්ගේ ලිපිය අනුව එම ඉදිකිරීම් අත්හිටුවා තිබුණද මෙම ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත්කරු වෙත ලබා දෙන ලද රු.1,445,847 ක අත්තිකාරම් මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | අත්තිකාරම අය කර ගැනීමට අදාළ කටයුතු සිදුකරමින් පවතින බව. | ගෙවන ලද අත්තිකාරම් මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සායන මධ්‍යස්ථානය හා පෙරපාසල් ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාලව ලබා දුන් අත්තිකාරම් මුදල අයවීම පරීක්ෂාව | | |
| (i) | කොන්ත්‍රාත් ගිවිසුමේ, කොන්ත්‍රාත් කොන්දේසි ( Conditions of Contract ) අංක 14.2 ප්‍රකාරව අත්තිකාරම් මුදල ගෙවීමේදී Provisional sums අඩුකර ඉතිරි කොන්ත්‍රාත් මුදලින් සියයට 20 ක් ගෙවිය හැකි වුවත් නගර සභාව විසින් මුළු කොන්ත්‍රාත් මුදල පාදක කරගෙන රු.46,424,517 ක් ගෙවා තිබීම හේතුවෙන් කොන්දේසිවලට පටහැනිව කොන්ත්‍රාත්කරුට රු.8,442,000 ක මුදලක් අත්තිකාරම් ලෙස වැඩිපුර ගෙවා තිබුණි. | එම මුදල නිරවුල් කිරීමට කටයුතු කර ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රයට අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | මූලික කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව වැඩ ආරම්භ කළ දිනය 2021 අප්‍රේල් 21 ලෙසත් වැඩ අවසන් කළ යුතු දිනය 2022 ඔක්තෝබර් 13 ලෙසත් හඳුනාගෙන තිබුණු අතර, කාලය දීර්ඝ කිරීම් අනුව කොන්ත්‍රාත් කාලය 2024 ජනවාරි 31 දින දක්වා දින දීර්ඝ කර තිබුණි. ඒ අනුව 2024 ජනවාරි 31 දින සිට විගණිත දින වන 2024 දෙසැම්බර් 31 දින දක්වා නැවත කාලය දීර්ඝ කර නොමැති අතර අත්තිකාරම් මුදලින් රු.20,698,861 ක වැඩ කොටස් ඉටුකර නොතිබුණි. | මෙම ව්‍යාපෘතියේ අධි ගෙවීම්, සම්බන්ධයෙන් බේරුම්කරණයකට යා යුතු වීම වැනි හේතු හා ඒ මත කොන්ත්‍රාත්කරුගේ මූල්‍ය ප්‍රවාහයට සිදුවූ බලපෑම වැනි හේතු මත ව්‍යාපෘතිය අවසන් කිරීම ප්‍රමාදව ඇත. කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් නව සංශෝධිත වැඩ සැළැස්මක් අනුව මාස තුනක් තුළ වැඩ නිම කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රයට අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | කොන්ත්‍රාත් ගිවිසුමේ, කොන්ත්‍රාත් කොන්දේසි (Conditions of Contract) අංක 14.2(9) ප්‍රකාරව අත්තිකාරම් මුදල් ගෙවීමෙන් පසු නිකුත් කරන ලද අතුරු ගෙවීම් සහතිකයේ සිට අත්තිකාරම් මුදල් අඩුකර ගත යුතු වුවත් ගෙවීම් බිල්පත් අංක 01,09,10,11,12 හා 13 මඟින් අත්තිකාරම් මුදල් අයකර නොතිබුණි. | මෙම අත්තිකාරම් මුදල පළමු බිල්පත මඟින් අය කර ගෙන නොමැත. තවද පෙර විගණන විමසුම අවසන් කිරිම හා සිදු වි තිබූ අතපසුවීම නිවැරදි කර ගැනිම අරමුණු කර ගනිමින් බිල්පත් අංක 09, 10, 11, 12, 13, 14 බිල්පත් මඟින් මුදල් අය කර අවසන් කිරිමට කටයුතු කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රයට අනුව කටයුතු කළ යුතුය. |
| (iv) | 2024 දෙසැම්බර් 30 දින වන විටත් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර ගෙන නොමැති බැවින් මහා නගර සභාව හා CCD කොන්ත්‍රාත්කරු සමඟ මේ වන විට නීත්‍යානුකූල ගිවිසුමක් නොපවතින බැවින් ලබා දී ඇති අත්තිකාරම් සුරක්ෂණය මුදල් බවට පත්කර අයකර ගත යුතු ඉතිරි අත්තිකාරම් මුදලට හිලව් කිරිමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | සියයට 75 පමණක් අවසන් වී ඇති අතර සියයට 90 ලඟා වී නොමැති නිසා මේ අවස්ථාව වන විට 15 වන බිල්පත පරික්ෂා කරමින් පැවතිම මත අත්තිකාරම් ඇපකරය මුදල් බවට පත් කිරිමට කටයුතු නොකල බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රයට අනුව කටයුතු කළ යුතුය. |
| (v) | කොන්ත්‍රාත් ගිවිසුම් කාලය 2024 ජනවාරි 31 දිනෙන් අවසන් වී ඇති නමුත් 2024 දෙසැම්බර් 31 දින වන විටත් කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් වී නොතිබුණි. කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි ( Conditions of Contract ) අංක 8.7 ට අනුව ප්‍රමාද ගාස්තු ලෙස ( Liquidated Damages) රු.23,212,258 ක් කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු බිල්පතෙන් අඩු කළ යුතු වුවත් එම වටිනාකම අඩු කිරීමට කටයුතු කර නොතිබුණි. | වැඩිපුර ගෙවීම් සියල්ල අය කර ඇති අතර, නව සංශෝධිත වැඩ සැලැස්මක් තුළ කඩිනමින් වැඩ නිම කිරිමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රයට අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) | **කාය වර්ධන මධ්‍යස්ථාන ගොඩනැගිල්ල** | | |
| (i) | ගොඩනැගිල්ලෙහි වීදුරු තුලින් හිරු එළිය ගොඩනැගිල්ල තුලට ගමන් කිරීම හේතුවෙන් ව්‍යායාම් උපකරණවලට හානිවීම් සිදුවී තිබෙනු නිරීක්ෂණය වූ අතර, වැසිකාලවලදී එම වීදුරු තුලින් ජලය ගොඩනැගිල්ල තුලට කාන්දු වීම හේතුවෙන් ගොඩනැගිල්ල තුල ජලය රැස්වන බවට නිරීක්ෂණය විය. | මෙම ඉදිකිරීම් සිදුකළ කොන්ත්‍රාත්කරුගේ රැඳවුම් මුදල් නිදහස් කර නොමැති අතර, වීදුරු තුළින් ගොඩනැගිල්ල තුළට ජලය කාන්දුවීම සහ පුපුරා ඇති බිත්ති නැවත සකස් කරන ලෙස එම කොන්ත්‍රාත්කරුට දන්වා ඇති බව. | අඩුපාඩු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | කාය වර්ධන මධ්‍යස්ථාන ගොඩනැගිල්ලෙහි ස්ලැබ් එක මතින් සිදුවන ජල කාන්දුව පිළිසකර කිරීම සඳහා රු.1,032,594 ක් වැයකර කොලම් 28 ක් පමණක් ස්ලැබ් එක මත ඉදිකර තිබූ අතර වහලයක් ඉදිකිරීමට නොහැකි වීමෙන් අපේක්ෂා කළ ජල කාන්දුව වලක්වා ගැනීමට නොහැකි වී තිබුණි. | මෙම ගොඩනැගිල්ලේ මූලික සැලැස්ම තට්ටු 04 ක් වන අතර මේ වන විට තට්ටු 02 ක් ඉදිකර ඇති බැවින් උඩ ස්ලැබ් එකෙන් වර්ෂාව පවතින දිනවලදී ජලය එකතු වීම නිසා මෙම තත්ත්වය උද්ගතවී ඇති බව හා එය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිසි පරිදි සැලසුම් සකස් කර ඒ අනුව කටයුතු කළ යුතුය. |

### 3.7 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නගර සභාවේ අනුමත කාර්යය මණ්ඩලය තුළ ආදායම් පරීක්ෂකවරු 07 ක් සිටිය යුතු වුවත් 2024 දෙසැම්බර් 31 දින වන විට එක් නිලධාරියෙකු පමණක් සේවයේ නිරතව සිටින අතර දීර්ඝ කාලයක් තිස්සේ එම තනතුරට අදාළ නිලධාරීන් බඳවා නොගෙන කාර්යයාල සහයක, රියදුරු, කම්කරුවන්, මුරකරුවන් හා දෛනික පදනම මත බඳවාගෙන ඇති 10 දෙනෙක් මඟින් වැඩ ආවරණ කරමින් තිබුණි. | පවතින ආදායම් පරීක්ෂක තනතුරු සම්පූර්ණ කර දෙන ලෙස ප්‍රධාන ලේකම් වෙතින් ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කර විධිමත් රාජකාරී පැවරීමක් කළ යුතුය. |
| (ආ) | ස්ථාන මාරු වී ගිය, මිය ගිය සහ විශ්‍රාම ගිය නිලධාරීන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු රු.750,942 ක් වූ ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම නිලධාරීන් ස්ථාන මාරු වී ගොස් ඇත. ණය පියවන ලෙස ඔවුන් දැනුවත් කර ඇති බව. | හිඟ ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගිණුම්ගත වී ඇති රු.3,903,951 ක් වටිනා ණය ශේෂ 55 ක් සේවක ණය ලේඛනයට ඇතුළත් වී නොතිබුණි. | සේවක ණය ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරමින් පවතින බව. | සේවක ණය ලේඛනයට ඇතුළත් කර යාවත්කාලනව පවත්වාගෙන යා යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 පිළිතුරු නොලත් විගණන විමසුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සිදු කළ විගණනයට අදාළව නිකුත් කරන ලද විගණන විමසුම් 07 කට මහා නගර සභාව විසින් නියමිත කාලය තුළ පිළිතුරු ලබාදී නොතිබුණු අතර එම විමසුම් වලින් රු.32,338,170 ක් වටිනාකමකින් යුතු කරුණු සම්බන්ධයෙන් විමසීම් කර තිබුණි. | පිළිතුරු සකස් කරමින් පවතී. සති දෙකක් තුළ ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | නියමිත කාලය තුළ විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කළ යුතුය. |